පුවත්පත් තුළ, විවිධ සිදුවීම් ටැබ්ලොයිඩ් පන්නයේ වාර්තාවන් ලෙසින් ඉදිරිපත් කරන කොලම තීරු දැකිය හැක.

මෙම ඇතැම් කොලම තීරු, හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) අන්දමින් ඉදිරිපත් වන බව ද දැකීමට හැක.

කෙසේ නමුත්, එවැනි කොලමකට වුවද, පුවත්පතක අනෙකුත් වාර්තාවන් සඳහා අදාළ වන මාධ්‍ය මාර්ගෝපදේශයන් අදාළ නොවන්නේ දැයි පාඨක අප විමසිය යුතු වේ.

ලංකාදීප පුවත්පතේ, "දෙයියෝ සාක්කි" තීරුවේ, "බඩ අඩුකරගන්න අමුතු ව්‍යායාමයක් කියාදෙන්න ගිහින්" යන සිරස්තලයෙන් යුතුව පළ වූ වාර්තාව මෙහිදී සැලකිල්ලට ගත හැක. එහි අන්තර්ගතයේ ද සඳහන් වී තිබුණේ, විශ්‍රාමික හමුදා නිලධාරියෙකු, කාන්තාවකගේ කැමැත්ත නොමැතිව, "ඇගේ බඩ පෙදෙස අතගෑ" බවයි.

මෙය සම්පූර්ණයෙන් කියවීමේදී පැහැදිලි වන්නේ, මෙය ලිංගික අපයෝජනයක් මිස වෙනත් කිසිවක් නොවන බවයි.

ඔබ සිතන ලෙසට,

1) මෙවැනි කොලමක වුවත්, ලිංගික අපයෝජනයක් මෙසේ සැහැල්ලු කොට දක්වමින් වාර්තා කිරීම පිළිගත හැකි මාධ්‍ය භාවිතාවක් ද?

2) සමාජය තුල ලිංගික අපරාධ සාමාන්‍යකරණය වීමට, මෙවැනි වාර්තාකරණයන් ද රුකුලක් ලබා නොදෙන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!